නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.4 - බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරයි.

- මුදල් ගිණුම ව්‍යාපාරයේ දෘෂ්ටි කෝණයෙන් වත්කම් ගිණුමක් වන අතර,ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවේ පවත්වා ගනු ලබන ජංගම ගිණුම බැංකුවේ දෘෂ්ටි කෝණයෙන් වගකීම් ගිණුමක් වේ.
- ඒ අනුව මුදල් ලැබීම් ජර්නලයට ඇතුළත් කරන,බැංකුව සමඟ සිදු කරන ගනුදෙනු බැංකුව විසින් ජංගම ගිණුමට බැර කරනු ලබයි.
  උදා - බැංකුවේ මුදල් තැන්පත් කිරීම.
  බැංකුවේ චෙක්පත් තැන්පත් කිරීම්වලින් නිෂ්කාෂණය(උපලබ්ධි) වූ චෙක්පත්වල වටිනාකම

  ව්‍යාපාරය මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුළත් කරන බැංකුව සමඟ සිදු කරන ගනුදෙනු,බැංකුව විසින් ජංගම ගිණුමට හර කරයි.
  උදා - ව්‍යාපාරය නිකුත් කළ චෙක්පත්වල වටිනාකම්වලින් බැංකුවෙන් ගෙවීම් කර ඇති චෙක්පත්වල වටිනාකම

<u>අභ්‍යාස</u>

1.ව්‍යාපාරයේ මුදල් ගිණුමේ සටහන් නොවූ (ලැබීම් ජර්නලයේ හා ගෙවීම් ජර්නලයේ),බැංකු ප්‍රකාශනයේ ඇතුළත් වන අයිතම මොනවාද?

| ගෙවීම් ජර්නලයේ ඇතුළත් නොවූ | ලැබීම් ජර්නලයේ ඇතුළත් නොවූ |
|---|---|
| | |

2.බැංකු ප්‍රකාශනයේ සඳහන් වටිනාකම ලබා ගැනීම සඳහා මුදල් ගිණුමේ සංශෝධිත ශේෂයට ගැළපිය යුතු අයිතම මොනවාද?

3.මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ ආකෘති ඇඳ දක්වන්න.